# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1815/20 - 2013 ජුනි මස 21 වැනි සිකුරාදා — 2013.06.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය : 2/3/1/4/2.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : එල්ඩී/05/2001/අයිඑම්/296.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම් ආණ්ඩුවට ගැනීමට අදහස් කරන බව 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි..

**ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :**

මෙහි මහජන කටයුත්තක් යනු, කරගහතැන්න අධි ආරක්ෂිත කලාපයේ සංඥා කුළුණක් ඉදිකිරීම සඳහා නාවික හමුදාවට ඉඩමක් අත්පත්කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹන්ගඟ කෝරළේ සුළු කොට්ඨාසයේ ගම්මඩුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කරගහතැන්න ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2012.08.21 දිනැතිව සකස් කර ඇති මා. 1570 නමැති මූලික පිඹුරෙහි කැබලි අංක 1, 2, 3, 4 වශයෙන් දක්වා ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.1676 ක් වන කරගහතැන්න වත්ත නමැති ඉඩම.

**කැබලි අංක 1**

| | |
|---|---|
| *උතුරට* | : ස්වාධීන රූපවාහිනී ආයතනය සතු කරගහතැන්න වත්ත (හි.පි. 60784) |
| *නැගෙනහිරට* | : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කරගහතැන්න වත්ත (හි.පි 60784) සහ කැබලි අංක 4 ; |
| *දකුණට* | : කැබලි අංක 4 සහ 3; |
| *බටහිරට* | : කැබලි අංක 2, මුපිමා 1247 හි කැබලි අංක 1 සහ ස්වාධීන රූපවාහිනී ආයතනය සතු කරගහතැන්න වත්ත (හිපි 60784) |

ඉඩම් හිමිකම් කියන්නාගේ නම : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
ඉඩමේ ප්‍රමාණය : හෙක්. 0.0471

**කැබලි අංක 2**

| | |
|---|---|
| *උතුරට* | : මු.පි.මා 1247 හි කැබලි අංක 1 සහ ස්වාධීන රූපවාහිනි සතු කරගහතැන්න වත්ත සහ කැබලි අංක 1; |
| *නැගෙනහිරට* | : කැබලි අංක 1 සහ 4; |
| *දකුණට* | : කැබලි අංක 3 සහ මු.පි.මා 1247 හි කැබලි අංක 1; |
| *බටහිරට* | : මුපිමා 1247 හි කැබලි අංක 1 (මාර්ගය). |

ඉඩම් හිමිකම් කියන්නෙගේ නම : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
ඉඩමේ ප්‍රමාණය : හෙක්. 0.1071

**කැබලි අංක 3**

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 2 සහ 1; |
| *නැගෙනහිරට* | : කැබලි අංක 4; |
| *දකුණට* | : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කරගහතැන්න වත්ත (හිපි60784) සහ මුපිමා 1247 හි කැබලි අංක 1; |
| *බටහිරට* | : මුපිමා 1247 හි කැබලි අංක 1 (මාර්ගය) සහ මෙම පිඹුරේ කැබලි අංක 2. |

ඉඩම් හිමිකම් කියන්නාගේ නම : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
ඉඩමේ ප්‍රමාණය : හෙක්. 0.0072

**කැබලි අංක 4**

*උතුරට* : කැබලි අංක 1;

*නැගෙනහිරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කරගහතැන්න වත්ත (හිපි 60784);

*දකුණට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කරගහතැන්න වත්ත (හිපි 60784);

*බටහිරට* : මුපිමා 1247 හි කැබලි අංක 1, මෙම පිඹුරේ කැබලි අංක 3, 2 සහ 1.

ඉඩම් හිමිකම් කියන්නාගේ නම : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

ඉඩමේ ප්‍රමාණය : හෙක්. 0.0062

ඉහත නම් සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2013 අගෝස්තු මස 26 වැනි දින පෙ.ව. 10.00 ට අඹන්ගහකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2013 අගෝස්තු මස 19 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. ඉඩමට ඇති හිමිකම් තහවුරු කිරීම සඳහා ඔප්පු හා අදාළ ලියකියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

බී. එම්. එස්. දමයන්ති පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
අඹන්ගහකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,
මාතලේ දිස්ත්‍රික්කය.

.
2013 මැයි මස 21 වැනි දින,
අඹන්ගහකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 119

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.